**කුරුණෑගල දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 56 - 2024**

**-----------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 56 හි 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** 2024 වර්ෂයට අදාළව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 56 කට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර එම වාර්තාවල කාරක සභා 06 ක මතය වියාචනය කරද එක් කාරක සභාවක අහිතකර මතයක් හා කාරක සභා 49 ක තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි.එම මතයන් සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | **විගණන නිරීක්ෂණ** | **කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අවසන් ඉතිරි තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කර ගිණුම් වාර්තාවල දැක්විය යුතු වුවත් කාරක සභා 34 ක් ඊට අනුකූල නොවන පරිදි ශුද්ධ උපලබධි අගය ගණනය කිරීමෙන් තොරව පිරිවැයට ගිණුම්ගත කර තිබුණි. | 2025 වර්ෂයේ සිට නිවැරදි කිරීමට උපදෙස් ලබාදෙන බව | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව තොගය අගය කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණ** | **කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 23 ක අක්කර 34 රූඩ් 01 පර්චස් 13 ක ඉඩම් පවරාගෙන ගිණුම්ගත කිරීමටත් කාරක සභා 26 ක අක්කර 31 රූඩ් 02 ක ඉඩම් තක්සේරු කර ගිණුම් ගත කිරීමටත් කටයුතු කර නොතිබුණි. | පවරාගෙන නොමැති ඉඩම් පවරාගැනීමටත් ඉඩම් තක්සේරු කර වටිනාකම් ගිණුම්ගත කිරීමටත් කටයුතු කරන බව | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කාරක සභාවට අයත් ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 15 ක පැල සිටුවන යන්ත්‍ර, වල් නෙලන යන්ත්‍ර, මල්ටි චොපර් යන්ත්‍ර වැනි යන්ත්‍රසූත්‍ර 10 ක්, කාරක සභා ගොඩනැගිලි 06ක්, ගොවිජන බැංකු ගොඩනැගිල්ලක්, රජයේ නිවාසයක්, අලෙවි සැල් 05 ක්, බොජුන්හලක්, ගබඩා ගොඩනැගිලි 09ක් හා කාර්යාල උපකරණ 06 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2025 වර්ෂය තුළදී ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදෙන බව. | කාරක සභාවට අයත් සියළු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 05 ක ඉකුත් වර්ෂයට අදාළ වූ රු.252,838 ක ආදායම්ද, කාරක සභා 07 ක රු.1,277,265 ක වියදම්ද සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් වර්ෂයට අදාළ ආදායම් හා වියදම් නිවැරදිව ගලපා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 09 ක රු.154,879ක ආදායම්ද, කාරක සභා 02 ක රු.5,635 ක වියදම්ද, කාරක සභා 04 ක රු.235,622 ක ජංගම වත්කම්ද කාරක සභා 03 ක රු.11,516ක ජංගම වගකීම්ද එක් කාරක සභාවක ජංගම නොවන වත්කම් රු.20,285 ක්ද, එක් කාරක සභාවක සමුච්චිත අරමුදල රු.488,631 ක්ද සමාලෝචිත වර්ෂය තුළ වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර ගොවිජන සේවා කාරක සභා 10 ක රු.319,334 ක ආදායම්ද, කාරක සභා 04 ක රු.39,608 ක වියදම්ද, කාරක සභා 08 ක රු.914,010 ක ජංගම වත්කම්ද කාරක සභා 04 ක රු.15,416 ක ජංගම වගකීම්ද එක් කාරක සභාවක රු.80,409 ක ජංගම නොවන වත්කම්ද එක් කාරක සභාවක සමුච්චිත අරමුදල රු.2,600 ක්ද සමාලෝචිත වර්ෂය තුළ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් වර්ෂයට අදාළ ආදායම් හා වියදම් සහ වත්කම් හා වගකීම් සම්පූර්ණව හා නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු අතර, ඊට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතියක් ශක්තිමත් කළ යුතුය. |
| (ඉ) | කාරක සභා 09 ක ගිණුම් ගත කර තිබුණු රු.224,709 ක තොග අයිතම හා කාරක සභා 11 ක ගිණුම් ගත කර තිබුණු රු.2,791,180 ක් වටිනා ස්ථාවර වත්කම් ඒකක 15 ක් හා තොග වර්ග 453 ක් භෞතිකව නොපැවතුණි. | භෞතිකව නොපැවතීමට හේතු සොයාබැලීමට හා ගිණුම්වලින් ඉවත්කිරීමට ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් ලබාදීමට කටයුතු කරන බව | විධිමත් පරීක්ෂාවක් සිදු කර හේතු අනාවරණය කර ගැනීම හා ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල සුදුසු පරිදි ගැලපීම් කළ යුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 20 ක ගිණුම් විෂයන් 42 කට අදාළව මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති ශේෂයන් උපයෝගී වාර්තා සමඟ සැසඳීමේදී එකතුව රු.23,492,917 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නොසැසඳුණ ශේෂ සැසඳීම් කර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ගැලපිය යුතුය. |

### 1.3.4 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 14 ක රු.130,100,785 ක් වටිනාකමැති ජර්නල් සටහන් 418 ක් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | විධිමත් අනුමැතියක් සහිතව ජර්නල් සටහන් ඇතුළත් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 08 ක් විධිමත් අනුමැතියකින් තොරව රු.285,997 ක් වටිනාකමැති හර ශේෂ 18 ක්ද, රු.652,476 ක වටිනාකමැති බැර ශේෂ 19 ක්ද සමුච්චිත අරමුදලට ලියා හැර තිබුණි. | කාරක සභා අනුමැතිය ගෙන විගණනයට ඉදිරිපත් කරන බව | කපා හැරීම් හා සමුච්චිත අරමුදලට ගැලපීම් කිරීම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතු අතර, එසේ සිදු කර නොතිබීම සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |

### 1.3.5 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 02 ක 2005 හා 2018 වර්ෂවල සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එන එකතුව රු.77,054 ක අවිනිශ්චිත ගිණුම් බැර ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂය අවසානයටද නිරවුල් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | විධිමත් පරීක්ෂාවක් සිදු කර ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.3.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගොවිජන සේවා කාරක සභා 51 ක මුලා ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.165,579,016 ක වත්කම් විෂයයන් 203 ක සහ ගොවිජන සේවා කාරක සභා 42 ක එකතුව රු.88,739,639 ක වගකීම් විෂයයන් 103 කට අදාළ සවිස්තරාත්මක සටහන්, තක්සේරු වාර්තා, ශේෂ සනාථන සහතික, අදාළ වත්කම් ලේඛන සහ හිමිකම් සහතික පත්‍ර වැනි සාක්ෂි නොතිබීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීම නොහැකි විය. | නිසි පුහුණුවක් හා උපදෙස් ලබාදී ඉදිරි ගිණුම් වාර්තාවල මෙම අඩුපාඩු සකස් කර නිවැරදිව ඉදිරිපත් කරන බව | ගිණුම් ශේෂ තහවුරු කිරීමට අදාළ ලේඛන පවත්වා ගත යුතු අතර, අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| (i) | 14 (3) වගන්තිය | ආරවුල් පවතින කුඹුරුවල අඳ ගොවියන් විසින් ඉඩම් හිමියන්ට ගෙවීම පිණිස සභාවේ තැන්පත් කර තිබුණු ඉඩම් හිමි ප්‍රවේණි මුදල් රු.2,859,097 ක් ගොවිජන සේවා කාරක සභා 15 ක් විසින් ගෙවීම් නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සභා අරමුදලේ රඳවා ගෙන තිබුණි. | ගෙවීම් කල නොහැකිව පවත්නා ප්‍රවේණි මුදල් කඩිනමින් අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කරන බව | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ii) | 52 වගන්තිය | සෑම කන්නයකටම පෙරාතුව ගොවිජන කාරක සභා බල ප්‍රදේශය සඳහා කෘෂිකාර්මික වැඩසටහනක් පිළියෙල කළ යුතු වුවත්, කාරක සභා 44 ක් විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ක්‍රියාත්මක සැලැස්ම හා අයවැය ඇස්තමේන්තුව සකස් කර අනුමැතිය ලබාගෙන ඇති බව | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 53 (4) වගන්තිය | සෑම වසර 03 කට වරක්ම ඉඩම් නාම ලේඛන ප්‍රතිශෝධනය කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 46 ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | යාවත්කාලීන කර පවත්වාගෙන යන බව | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු අතර, එසේ නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 133 | ගොවිජන සේවා කාරක සභා 20 ක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් හෝ වගකිව යුතු නිලධාරියකු විසින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය මඟින් තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානවල විගණනයක් සිදුකරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අභ්‍යන්තර විගණන කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 264 | සෑම ගෙවීමකටම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ රු.3,305,837 ක් වටිනාකමැති ගෙවීම් වවුචර් 14 ක් සම්බන්ධයෙන් ගොවිජන සේවා කාරක සභා 05 ක් එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නොවීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර කුවිතාන්සි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 880 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 09 ඡේදය | මුදල් හෝ තොග සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා බලය ලබා දී ඇති සියලුම නිලධාරීන් විසින් ඇප තැබිය යුතු වුවද, ගොවිජන සේවා කාරක සභා 56හි සංවර්ධන නිලධාරී, විධායක ලේකම්, ගොවි බැංකු ලිපිකරු, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඇප තබා නොතිබුණු අවස්ථා වූ අතර ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2023 ජනවාරි 23 | චක්‍රලේඛ ප්‍රකාරව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් ඇප තැබීමෙන් නිදහස් කර ඇති බවත් අනිකුත් නිලධාරීන් ඇප තැබීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව සහ 01/2020 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දිනැති අංක 7/2/15/3/3(VII) තාව දරන ලිපියෙන් උක්ත මුදල් රෙගුලාසියට අනුකූල නොවන පරිදි කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් ඇප තැන්පත් කිරීමෙන් නිදහස් කර තිබුණි. | | |
| (ඇ) | **ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ** | | | |
| (i) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන චක්‍රලේඛයේ 5.6 (i) ඡේදය | ගොවිජන බැංකුව ගොවිජන කාරක සභාවේ ඒකකයක් බැවින් ගොවිජන බැංකුවට අදාළ සියළුම ගිණුම් ගොවිජන සේවා කාරක සභාවේ වාර්ෂික ගිණුම්වලටද ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, කාරක සභා 56 ම එසේ කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛන හා ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි කටයුතු කරන බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පියවර ගත යුතුය. |
| (ii) | 2014 අගෝස්තු 22 දිනැති අංක 7/2014 (107 සංශෝධන III) දරන චක්‍රලේඛය | දෛනිකව කම්ටු ලිපිකරුට අත රඳවා ගත හැකි උපරිම මුදල රු.10,000 ක් වුවද, ගොවිජන සේවා කාරක සභා 27 ක අවස්ථා 479 කදී ඊට වැඩි මුදලක් අත රඳවා ගෙන තිබුණි. | නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇති බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (iii) | 2019 ඔක්තෝබර් 22 දිනැති අංක 7/12/5/4 දරන ලිපිය හා 2020 ඔක්තෝබර් 08 දිනැති අංක 09/2020 දරන චක්‍රලේඛය | සියලුම ලියාපදිංචි ගොවි සංවිධානවල ගනුදෙනු අදාළ ගොවිජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් මඟින් සිදු කළ යුතු නමුත් ගොවිජන බැංකු 36 ක ගොවි සංවිධාන 1,531 කින් සංවිධාන 979 ක් ගොවිජන බැංකුවේ ගිණුම් ආරම්භ කර නොතිබුණි. | ගොවි සංවිධාන දැනුවත් කිරීමට කටයුතු කරන බව | විධිමත් වැඩපිළිවෙලක් යොදා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ගොවිජන බැංකුව තුළ ගොවි සංවිධාන ගිණුම් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2024 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 56 හි එකතුව රු.37,598,275 ක ශුද්ධ අතිරික්තයක්ද, ගොවිජන බැංකු 56 හි එකතුව රු.17,207,830 ක අතිරික්තයක්ද වූ අතර ඊට අනුරූපීව 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 56 හි එකතුව රු.31,017,816 ක ශුද්ධ අතිරික්තයක්ද, ගොවිජන බැංකු 56 හි එකතුව රු.23,195,294 ක අතිරික්තයක්ද විය.

### 2.1.1 විශ්ලේෂණාත්මක සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 49 ක රු.40,246,606 ක අතිරික්තයක් ලබාගෙන තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 52 ක අතිරික්තය රු.31,774,009 ක් විය. ඒ අනුව රු.8,472,597 ක අතිරික්තයේ වැඩිවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ කාරක සභා 07 ක ඌනතාවය රු.2,648,331 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක සභා 04 ක ඌනතාවය රු.756,193 ක් විය. ඒ අනුව ඌනතාවයේ වැඩි වීම රු.1,892,138 ක් වුවද, අතිරික්තයේ වැඩිවීම ගැලපීම නිසා කාරක සභා 56හි සමස්ථ අතිරික්තය රු.6,580,459 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අතිරික්ත මුදල් ආයෝජනය කිරීම

### 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 56 හා ගොවිජන බැංකු 56 විසින් එකතුව රු.110,325,810 ක් ඵලදායිව ආයෝජනය කිරීමෙන් තොරව රජයේ වාණිජ බැංකු ජංගම ගිණුම්වල රඳවාගෙන තිබුණු අතර එකතුව රු.130,272,307 ක මුදලක් අඩු පොලී ආදායමක් ලැබෙන ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර තිබුණි. ඒ අනුව අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අරමුදල් ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු කරන බව | විධිමත් අනුමැතිය යටතේ අතිරික්ත අරමුදල් වඩාත් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක් සතුව පවතින බැංකු ගිණුම් 08 ක් දීර්ඝ කාලයක සිට අක්‍රියව පවතින අතර එම ගිණුම් ශේෂවල එකතුව රු.2,232,360 ක් විය. මෙම මුදල් වඩාත් ඵලදායී ආයෝජනයක යෙදවීමෙන් ආදායම වැඩිකරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඵලදායී ආයෝජනයක (ස්ථාවර තැන්පතු) යෙදවීමට කටයුතු කරන බව | විධිමත් අනුමැතිය යටතේ නිෂ්කාර්ය මුදල් වඩාත් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාවතගම ගොවිජන සේවා කාරක සභාවේ 2020 වර්ෂයට අදාලව හඳුනා ගන්නා ලද තොග ඌනතා සඳහා අය කර ගත යුතු රු.771,097 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කර ගෙන නොතිබුණ අතර මුදල් වංචාව | විමර්ශන කටයුතු සිදු කරමින් පවතින බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අය විය යුතු මුදල් කඩිනමින් අය කර ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර විනය |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳ පරික්ෂණ කටයුතු නිම වී නොතිබියදී අදාළ නිලධාරිනිය නැවත සේවයේ පිහිටුවා තිබුණි. | | ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | රඹේ ගොවිජන සේවා කාරක සභාවේ 1999 වර්ෂයට පෙර කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරියෙකු විසින් ගොවිජන බැංකු මුදල් හා අක්කර බදු මුදල් අයථා ලෙස පරිහරණය කිරීමෙන් සිදු කළ මූල්‍ය වංචාවට අදාළව අයවිය යුතු රු.137,706 ක් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතු අතර, එම මුදල කාලීනව අය කිරීමට කටයුතු නොකළ පාර්ශව වෙතද පියවර ගත යුතුය. |
| (ඇ) | නාථගනේ ගොවිජන බැංකුව නිවැරදිව මුදල් පොත තුලනය නොකිරීම, ණය නිකුත් කිරීමේදී චෙක්පත් අවභාවිතා කිරීම, ලෙජර්ගත නොකළ ණය මුදල් සහ එම ණය පොලිය වශයෙන් ගොවි බැංකුවේ 2020 ජනවාරි 01 සිට 2021 ජුලි 05 දින දක්වා කාලයට අදාලව සිදුවූ ගනුදෙනු තුළින් සිදු කර ඇති ඌනතාවය රු.2,954,156 ක් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණු අතර කුවිතාන්සි පොත් 06 ක් අස්ථානගතවී තිබුණු අතර එම අස්ථානගතවූ කුවිතාන්සිවලට අදාළ ගනුදෙනුද සටහන්වී නොතිබුණි. | විමර්ශන කටයුතු සිදුකරමින් පවතින බව | විමර්ශන කටයුතු කඩිනමින් නිම කර, අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමටත්, අදාළ පාර්ශව වෙත විනය පියවර ගැනීමත් කළ යුතුය. |
| (ඈ) | තාරණ ගොවිජන බැංකුවේ ලෙජර් පරික්ෂා කිරීමෙන් අනාවරණය කර ගත් රු.3,310,450 ක මූල්‍ය වංචාවකින් තවදුරටත් අයවිය යුතු ශේෂය රු.2,491,649 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදීද එම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි මුදල් අයකරගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව | අයවිය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වත්කම් අත්පත් කරගැනීමට අදාළව දීර්ඝ කාලයක සිට ගෙවිය යුතු ණය ලෙස ඉදිරියට ගෙන එනු ලබන ගොවිජන සේවා කාරක සභා 33 ක එකතුව රු.22,832,891 | නිරවුල් කිරීමට කටයුතු කරන බව | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කිරීමටත්, වත්කම් භෞතිකව නොමැතිවීමට හේතු |

| | | | |
|---|---|---|---|
| | ක ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණ අතර මෙම ණය ශේෂයන්ට අදාළ වත්කම් බොහොමයක් කාරක සභාව තුළ භෞතිකව දක්නටද නොලැබුණි. | | පරික්ෂා කර විධිමත් පියවර ගැනීමත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වන විට ගොවිජන සේවා කාරක සභා 19 ක වී වගාව සඳහා යෙදවිය හැකි A ශ්‍රේණියේ පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 365 රූඩ් 01 පර්චස් 36 ක් පමණ වන අතර ගොවිජන සේවා කාරක සභා 11 ක වී වගාව හැර වෙනත් වගාවන් සඳහා යෙදවිය හැකි B ශ්‍රේණියේ පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 145 පර්චස් 30 ක් පමණද ගොවිජන සේවා කාරක සභා 18 ක C කාණ්ඩයට අයත් පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 620 රූඩ් 01 පර්චස් 10 ක් පමණ විය. මෙම පුරන් කුඹුරු සමාලෝචිත වර්ෂය තුළ වී වගාව හෝ වෙනත් වගාවන් සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේ ආරම්භ කර ඇති ජාතික වැඩසටහන අනුව කුඹුරු ඉඩම් අස්වැද්දීමට අදාළව කටයුතු සිදුකරමින් පවතින බව | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව සෑම කුඹුරු ඉඩමක්ම අදාළ පරිදි වගාව සඳහා යෙදවීමට විධිමත් වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 12 ක පැවති රු.1,672,704 ක් වටිනා කල් ඉකුත් වූ තොග සම්බන්ධයෙන් 2006 දෙසැම්බර් 08 දිනැති අංක 2006/08 හා එහි සංශෝධිත ඇතුළත් 2017 නොවැම්බර් 28 දිනැති 16/2017 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි. | ගොවිජන සේවා කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන මෙම ශේෂ කපාහැරීම සඳහා කටයුතු කරන බව | චක්‍රලේඛ අනුව කටයුතු කර විධිමත් පරිදි කල් ඉකුත් වූ තොග, තොග පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 05 ක වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන ලද අක්කර බදු හිඟ ආදායම රු.376,823 ක්ද ගොවිජන කාරක සභා 03 ක කාමර කුලී හිඟ ආදායම රු.275,195 ක්ද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය කර ගැනීම සඳහා කටයුතු කරන බව | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර ඒවා කාලීනව අය කිරීමට කටයුතු නොකළ කිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 10 කින් 2000 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළව එකතුව රු.249,460 ක විගණන ගාස්තු අය විය යුතුව තිබුණි. | කඩිනමින් ගෙවීමට කටයුතු කරන බව | කඩිනම් වැඩපිළිවෙලක් යොදා හිඟ විගණන ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එනු ලබන ගොවිජන සේවා කාරක සභා 47 ක රු.48,238,177 ක ලැබිය යුතු ශේෂ 294 ක් අය කර ගැනීමටත් ගොවිජන සේවා කාරක සභා 46 ක රු.51,089,328 ක ගෙවිය යුතු ශේෂ 244 ක් නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | අදාළ ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව | විධිමත් පරිදි ශේෂ සනාථ කර ගැනීමෙන් පසු මුල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවත එන ලැබිය යුතු ශේෂ සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 26 ක කෘෂි උපකරණ 07 ක්, ගබඩා 04 ක්, ජල බිංදු පද්ධතියක්, පැල සිටුවන යන්ත්‍ර 04 ක්, වල් නෙලන යන්ත්‍ර 13 ක්, පැල කූටි 05 ක්, බිත්ති සේප්පුවක්, අලෙවිසැල් 03 ක්, බොජුන්හල් 02 ක්, උර මහන යන්ත්‍රයක්, මුදල් ගණන්කිරීමේ යන්ත්‍රයක්, ස්කෑන් යන්ත්‍රයක්, මුද්‍රණ යන්ත්‍ර 03 ක්, පරිගණක හා උපාංග 02 ක්, LED රූපවාහිනියක්, බීජ වැපුරුම් යන්ත්‍ර 03 ක්, කිරිහල ගොඩනැගිල්ල හා උපකරණ, ටැබ් යන්ත්‍රය හා ජලඋසමාපක 139 ක් හා සුළුවාරි මාර්ග උපකරණ නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි. | භාවිතා කල හැකි භාණ්ඩ වෙනත් ආයතන වෙත ලබාදීමට කටයුතු කරන බව | භාවිතයට ගතහැකි වත්කම් හා උපකරණ ප්‍රයෝජනයට ගැනීමටත් අනිකුත් වත්කම් හා උපකරණ විධිමත්ව අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා සහ ගොවිජන බැංකු 55 ක පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේදී රු.20,348,084 ක වියදමක් දරා තිබුණද සමාලෝචිත වර්ෂයේදීද එම පද්ධති ස්ථාපිත නොකිරීම නිසා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ උපදෙස්වලට අනුව පරිගණක හා උපාංග මිලදීගැනීමට කටයුතු කරන ලද බව | කඩිනම් වැඩපිළිවෙලක් යොදා සැලසුම් කළ පරිදි පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 14 ක වැව් 196 ක් සහ අමුණු 63 ක් අක්‍රීය වීම හේතුවෙන් අත්හැර දමා තිබුණු අතර ඇළ මාර්ග 118 න් 03 ක් අක්‍රීය තත්වයේ පැවතුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා තාක්ෂණික නිලධාරීන් නොමැතිවීම හේතුවෙන් වැව් අමුණු ප්‍රතිසංස්කරණ යාවත්කාලීනව කිරීමට නොහැකි වී ඇති බව | ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තාක්ෂණික සේවය ලබා ගෙන වාරිකර්මාන්ත හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු යාවත්කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන පරිදි ගොවිජන සේවා කාරක සභා 27 ක කෘෂි ළිං 2,306 ක් හා කෘෂි පාරවල් කිලෝමීටර් 2,012 ක් පැවති නමුත් කෘෂි ළිං 241 ක් හා කෘෂි පාරවල් කිලෝමීටර් 520 ක් ක්‍රියාකාරී නොවන මට්ටමේ පවතින හෙයින් අත්හැර දමා තිබුණු අතර මේවා ප්‍රතිසංස්කරණය කර කෘෂිකර්මාන්තය සඳහා භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රතිපාදන නොමැති බැවින් කටයුතු කිරීමට නොහැකි බව | ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කරවා ගෙන ප්‍රතිසංස්කරණ කටයුතු යාවත්කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 40 ක පැවති සුළු වාරි වැව් 3,222 ක්, අමුණු 1,072 ක් සහ ඇළ මාර්ග 118 කින් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ප්‍රමුඛතාව අනුව සකස් කළ ව්‍යාපෘති 710 ක් ඉදිරිපත් කර තිබුණද ව්‍යාපෘති 70 ක් පමණක් ක්‍රියාත්මක වී තිබුණි. | වෙන්කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය හා පවතින නිලධාරී හිගය මත ළඟා විය හැකි උපරිම ප්‍රගතිය කරා ළඟා වී ඇති බව | විධිමත් වැඩපිළිවෙලක් යොදා වාරිකර්මාන්ත හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු යාවත්කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා 56 හිම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද, ඊට අදාළ ප්‍රගති වාර්තා සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරන බවත් 2025 වර්ෂයේ සිට කාර්යසාධන වාර්තාවක් සැකසීමට කටයුතු කරන බව | ප්‍රගති වාර්තා පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව කාරක සභා 50 ක පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තු අනුව ආදායම් හා වියදම් විෂයයන් 810 කට අදාළව සියයට 01 සිට සියයට 30,607 දක්වා විචලනයන් පැවතුණි. මේ හේතුවෙන් අයවැය ලේඛනය කාරක සභා විසින් සඵලදායි පාලන උපක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණි. | නිලධාරී හිඟය මත අදාළ කාර්යයන් ඉටුකරගැනීමට නොහැකිවීම නිසා මෙවැනි විචලනයන් ඇති වී ඇති බව | අයවැය ලේඛනය සඵලදායි පාලන උපක්‍රමයක් ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 5. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහගිරිල්ල ගොවිජන බැංකුවේ රු.245,813 ක ආදායම් වැඩියෙන්ද, අඹන්පොල ගොවිජන බැංකුවේ රු.503,421 ක වියදම් අඩුවෙන්ද ගිණුම් ගත කර තිබුණි. | නිවැරදි කිරිමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන බැංකු 06 ක රු.30,801,996 ක වටිනාකමැති ජර්නල් සටහන් 1,522 ක් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ජර්නල් සටහන් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |
| (ඇ) | නාථගනේ ගොවිජන බැංකුවේ වටිනාකම රු.4,436,700 ක කොටස් තැන්පතු 5,001 ක් සඳහා ලෙජර් ගිණුම් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී ලේඛන ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට කටයුතු කරන බව | ලෙජර් ගිණුම් නිසි පරිදි පවත්වා ගෙන යා යුතු අතර, ගිණුම්කරණ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය. |
| (ඈ) | ගොවිජන බැංකු 15 ක කොටස් තැන්පතු 35,838 කින් තැන්පතු 22,603 ක්ද, ගොවිජන බැංකු 14 ක සාමාන්‍ය තැන්පතු 17,097 කින් තැන්පතු 18,964 ක්ද, ගොවිජන බැංකු 21 ක ළමා තැන්පතු 2,188 කින් තැන්පතු 1,465 ක්ද, ගොවිජන බැංකු 06 ක ගොවි සංවිධාන තැන්පතු 180 කින් 58 ක්ද ගොවිජන බැංකු 15 ක කුඩා | ඉදිරියේදී එම ගිණුම් සක්‍රියව පවත්වාගෙන යාමට ප්‍රාදේශීය නිලධාරීන් මඟින් දැනුවත් කරන බව | ගිණුම් ක්‍රියාකාරී තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කණ්ඩායම් තැන්පතු 1,330 කින් තැන්පතු 683 ක්ද ගොවිජන බැංකු 12 ක "සිතමු" කාන්තා තැන්පතු 388 කින් 98 ක්ද ක්‍රියාකාරී තත්ත්වයෙන් තොරව ආරම්භක තැන්පතුවලට පමණක් සීමා වී තිබුණි. | | |
| (ඉ) | ඉකුත් වර්ෂයන්ට අදාළව ගොවිජන බැංකු 20ක මිය ගිය ණයගැතියන් 40 කගෙන් අය විය යුතු හිඟ ණය ශේෂය රු.1,553,721 ක් සමාලෝචිත වර්ෂය තුළදීත් අදාළ ඇපකරුවන්ගෙන් හෝ අය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයේ උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරන බව | කඩිනම් වැඩපිළිවෙලක් යොදා ඇපකරුවන්ගෙන් හෝ හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ගොවිජන බැංකු 34 ක සමාලෝචිත වර්ෂය තුළ මාසිකව සිදු කරන ලද ගනුදෙනු පරික්ෂා කිරීමේදී දෛනිකව බැංකු ගනුදෙනු සාමාන්‍ය 01 ත් 10 ත් අතර ඉතා පහළ මට්ටමක පැවතුණි. | ගනුදෙනු සක්‍රීය හා ඵලදායී මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය නිලධාරින් මඟින් දැනුවත් කරන බව | කඩිනම් හා ආකර්ශනීය වැඩපළිවෙලක් යොදා ගනුදෙනු වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (උ) | ලියාපදිංචි ගොවීන් සංඛ්‍යාව 50,497 ක් හා කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 24,587 ක් පැවතියද ගොවිජන බැංකු 31 ක වසම් 869 ක් අතරින් වසම් 342 ක් සඳහා පසුගිය වර්ෂයන්ට අදාළව ණය නිකුත් කර නොතිබුණි. එසේම, වසමේ ගොවීන්ගේ ණය අවශ්‍යතා හා ඒවා සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම, මඟපෙන්වීම අදාළ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින්ගේ වගකීම වුවද එය නිසි ලෙස ඉටු කර නොතිබුණි. | ණය නිකුත් කිරීම සඳහා ප්‍රාදේශීය නිලධාරින් මඟින් දැනුවත් කරන බව | බැංකු පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම උදෙසා ගොවීන් දැනුවත් කර ණය නිකුත් කිරීම වර්ධනය කර ගැනීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය. |
| (ඌ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 හා 2020 ඔක්තෝබර් 08 දිනැති අංක 09/2020 දරන (04/2012 සංශෝධන II ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ගොවිජන සේවා කාරක සභා 33 ක ගොවීන් 1,158 දෙනෙකුගෙන් හිඟ ණය රු.107,451,657 ක ශේෂයක් අයකරගෙන නොතිබුණි. | අය කර ගැනීම සඳහා විනිශ්චය සභාව හා අධිකරණය වෙත යොමු කර ඇති බව | ණය ලබා දීම හා කාලීනව අය නොකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කර නිලධාරීන්ගේ අවභාවිතාවක් සිදු වීද යන්න සොයා බලා පියවර ගැනීමත්, චක්‍රලේඛ ප්‍රකාරව ණය මුදල් නියමිත කාලය තුළ අයකරගැනීමටත් කටයුතු කල යුතුය. |